# පාස්කු සතියේ
# සඳුදා

## පළමුවන කියැවීම

අපෝස්තුළුවරුන්ගේ ක්‍රියාපොතෙන් ගත් පාඨයෙකි ක්‍රියා 2 :14, 22-32

**දෙවියන් වහන්සේ ජේසුස් ස්වාමීන් වහන්සේ මරණයෙන් උත්ථාන කළ සේක.**

එකොළොස් දෙනා සමග නැගී සිටි පේදුරු තුමා ශබ්ද නගා ඔවුන්ට මෙසේ කීය. "ජුදෙව් ජනයෙනි, ජෙරුසලමේ වසන සියල්ලෙනි, මෙය දැනගන්න. මගේ වචනවලට සාවධානව සවන් දෙන්න. ඉශ්රායෙල් ජනයෙනි මේ වචනයට සවන් දෙන්න. ඔබ ම දන්නා ලෙස නාසරෙත්හි ජේසුස් වහන්සේ දෙවියන් වහන්සේ විසින් තෝරා පත් කරන ලද මනුෂ්‍යයෙකි. ඒ බව දෙවියන් වහන්සේ උන් වහන්සේ මගින් ඔබ අතර කළ ප්‍රබල ක්‍රියාවලින් ද අරුම පුදුම දේවලින් ද ලකුණුවලින් ද පෙන් වූ සේක. එම ජේසුස් වහන්සේ දෙවියන් වහන්සේ නියමිත අභිප්‍රාය හා පෙර දැනුම අනුව පාවා දෙනු ලැබූ සේක. ඔබ අදමිටු මිනිසුන් ලවා උන් වහන්සේ කුරුසියෙහි ඇණ ගස්වා මරා දැමුවහුය. එහෙත් දෙවියන් වහන්සේ මරණ බන්ධනයෙන් උන් වහන්සේ මුදා උත්ථාන කර වදාළ සේක. මන්ද මරණයට උන් වහන්සේ බැඳ තබා ගත නොහැකි විය. දාවිත් උන් වහන්සේ ගැන කතා කරමින් මෙසේ කිය.

"ස්වාමීන් වහන්සේ නිරතුරු මා ඉදිරියේ සිටිනු දුටිමු. මා නොසැලෙන පිණිස උන් වහන්සේ මාගේ දකුණු පසෙහි සිටින සේක.
එබැවින් මාගේ හද සොම්නස් විය. මාගේ වචන ප්‍රමුදිත විය. මාගේ සිරුර ද බලාපොරොත්තුවෙන් පුල පුලා සිටින්නේය. මන්ද ඔබ වහන්සේ මාගේ ජීවිතය පාතාලයෙහි දමන්නෙ වත් ඔබගේ දැහැමි තැනැත්තා ජරාපත් වන්නට ඉඩ දෙන්නේ වත් නැත. ඔබ ජීවනයේ මාර්ගයන් මට දැන්වූ සේක.
ඔබගේ වැඩ විසීමෙන් ඔබ මා ප්‍රීතියෙන් පුරවන සේක."

“සහෝදරවරුනි, ආදි පිතෘ වන දාවිත් මළ බවත්, තැන්පත් කරනු ලැබූ බවත් නොවළහා කියන්නට කැමැත්තෙමි. ඔහුගේ සොහොන අද දක්වා අප අතරේ ඇත. ඔහු දිවැසිවරයෙකු වූ බැවින් ඔහුගේ වංශයෙන් කෙනෙකු ඔහුගේ සිංහාසනය පිට හිඳුවන සේකැ” යි දෙවියන් වහන්සේ දිවුරුමකින් ඔහු දිවුළ බව ඔහු දැන ගත්තේය. ඔහු මෙය කල් මත්තෙන් දැක ක්‍රිස්තුස් වහන්සේගේ පුනරුප්පජීවනය ගැන කතා කරමින්,

‘උන්වහන්සේ පාතාලයෙහි හැර දමනු නොලැබූ බවත් උන් වහන්සේගේ සිරුර ජරාපත් නොවූ බවත් කීය.”

‘දෙවියන් වහන්සේ මෙය ජේසුස් වහන්සේ මරණයෙන් උත්ථාන කොට වදාළ සේක. එයට අපි සියල්ලෝ සාක්ෂිකාරයෝ වෙමු.’

දේව වාක්‍යය එසේය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 16 : 1, 2, 5, 7–11

පිළිතුර: මාගේ සරණය වන දෙවිඳුනි, මා රැකගත මැනව. ආලේලූයා //

ගීය:

දෙවිඳුනි, මම ඔබ සරණ කොට ගතිමි. එබැවින් මා රැකගත මැනව. මම මෙසේ කීමි. “සමිඳුනි, ඔබ මාගේ ස්වාමින් වහන්සේ ය. මාගේ සව් සම්පත ය. ඔබ හැර අන් කිසි සෙතක් මට නැත්තේය.”
සමිඳුනි, මාගේ උරුමය හා ඉරණම ඔබ වහන්සේය. ඔබ, ඔබ පමණක්ම මා උරුම කොට රක්නා සේක.

මට උවදෙස් දෙන හිමිතුමන් හට තුති කරන්නෙමි. රෑ යාම්වල දී මා සිත් සතන්හි නුවණ පහළ වන්නේය.
හිමිතුමන් නිරතුරු මා අබියස තබා ගන්නෙමි. මා දකුණු පස එතුමාණන් වැඩ වසන බැවින් මම නොසැලෙන්නෙමි.

එබැවින් මසිත උදන් අනයි. මහද ප්‍රීතියෙන් පිනා යන්නේය. මා ගත සුරැකිව ඇත්තේ ය.
මන්ද ඔබ මා පාතාලයෙහි නොරඳවන සේක. ඔබේ දැහැමි තැනැත්තා ජරාපත් වීමට ඉඩ නොදෙන සේක.

ඔබ මට ජීවන මග හෙළි කරන සේක. ඔබ අබිමුවෙහි පිරිපුන් සතුට මට වන්නේය. ඔබ දකුණු පස සැප සම්පත් සදහටම ඇත්තේය.

## සාධුකාරය

ආලේලූයා! ආලේලූයා!
මෙන්න සමිඳුන්ගේ ජය මංගල දිනය! මෙදින අපි ප්‍රීති වෙමු. සන්තෝෂ වෙමු.
ආලේලූයා!

## සුවිශේෂය

සුවිශේෂක මතෙව් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

මතෙව් 28 : 8-15

**ගලීලයේ දී මාගේ සොහොයුරෝ මා දකින්නෝය.**

එවිට ඔව්හු භයින් ද මහත් ප්‍රීතියෙන් ද යුක්තව සොහොන් ගෙයින් වහාම නික්ම ගොස්, උන් වහන්සේගේ ශ්‍රාවකයන්ට දන්වන පිණිස දිවූහ. එකල ජේසුස් වහන්සේ

හදිසියේ ඔවුන්ට මුණ ගැසී "සෙත් වේවා" යි වදාළ සේක. ඔව්හු ළංවී උන් වහන්සේගේ පා වැළඳගෙන, උන් වහන්සේට පසඟ පිහිටුවා නමස්කාර කළහ. එවිට උන් වහන්සේ ඔවුන්ට කතා කොට "බිය නොවන්න. මාගේ සහෝදරයන් වෙතට ගොස් ගලීලය බලා යන්න ඔවුන්ට කියන්න. එහිදී ඔවුන් මා දකිනු ඇතැ"යි වදාළ සේක.

ස්ත්‍රීවරුන් මඟ යද්දී මුර සෙබළුන්ගෙන් සමහරෙක් නුවරට පැමිණ ඒ මුළු සිද්ධිය නායක පූජකවරුන්ට දැන්වූහ. එවිට ඔව්හු ප්‍රජා මූලිකයන් හා රැස්ව කුමන්ත්‍රණය කොට හේවායන්ට බොහෝ මුදල් දී "අපි රෑ නිදා සිටිය දී ඔහුගේ ශ්‍රාවකයෝ අවුත්, ඔහු සොරාගෙන ගියහ"යි කියන්න. මේ බව ආණ්ඩුකාරයාට ආරංචි වුනොත් අපි ඔහු කැමති කරවාගෙන ඔබ බේරා ගන්නෙමු"යි කීහ. ඔව්හු මුදල් රැගෙන තමන්ට ඉගැන්වූ ලෙස කළහ. මෙසේ ඒ කීම ජුදෙව්වරුන් අතරේ ප්‍රසිද්ධ වී අද දක්වාත් පැවත එයි.

සුවිශේෂ වාක්‍යය එසේය.